**ව්‍යවස්ථා සම්මන්ත්‍රණය**
2016 මාර්තු 29
වෝර්ටර්ස් එජ්
**ආරම්භක අදහස් දැක්වීම**

මෙහි පැමිණීම ගැන ඔබ සැම දෙනාට ම ස්තුතියි. ගරු අගමැතිතුමනි, පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමනි, මහා ලේකම්තුමනි, ගරු ඇමතිවරුනි, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනි, සම්පත් දායකයිනි, විශේෂ අමුත්තනි. නෝනාවරුනි. මහත්වරුනි.

ඔබ සියලු දෙනාට ම සුබ උදෑසනක් පතමින් මට මෙහි කථාවක් පැවැත්වීමට කරන ලද ආරාධනය ගැන ඔබ සැමට මගේ ස්තුතිය පුද කර සිටිමි.

ශ්‍රී ලාංකිකයන්ට ඔවුන්ගේ දීර්ඝ ප්‍රජාතන්ත්‍රවාදි ඉතිහාසය, එහි සුවිශේෂී සම්ප්‍රදායින්, සබඳතා හා ක්‍රියාකාරී ආයතන ගැන ආඩම්බර වීමට සාධාරණ අයිතියක් තිබේ. ඔබ ගැටුම් හා ස්වාභාවික ව්‍යසන වැනි අභියෝගයන්ට මුහුණ දෙමින් බහු පක්ෂ පද්ධතියක් තුළ ආණ්ඩු වෙනස් කරමින් වඩාත් පාරදෘශ්‍ය ප්‍රගතියක් ළඟා කර ගෙන තිබේ.

පසුගිය වර්ෂයේ ශ්‍රී ලංකාවේ ජනතාව ඔවුන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතින් ප්‍රයෝජනයට ගනිමින් යහපාලනය, වග වීම හා සියල්ලන්ට සමාන අවස්ථා ආදිය සඳහා දෙවරක් ම ඡන්දය ප්‍රකාශ කර තිබේ. ඔබේ ආණ්ඩුව අවශ්‍ය නීති සම්පාදනය කරමින් හා ප්‍රතිපෝෂණය හා මග පෙන්වීම සඳහා ස්වාධීන කොමිෂන් සභා, මාධ්‍යවේදීන් හා සිවිල් සමාජය සවි බල ගන්වා ඇත.

මෙම රටට නිදහස ලැබීමටත් පෙර අවුරුදු සිය ගණනක් ඈත ට යන දීර්ඝ කාලීන සබඳතාවක් එක්සත් ජනපදයටත් ශ්‍රී ලංකාවටත් තිබේ. මෙම මිත්‍රත්වයට පදනම් වී ඇත්තේ අපේ ජනතාවන් අතර ඇති ප්‍රජාතාන්ත්‍රික සාරධර්ම හා ප්‍රබල ආර්ථික හා සංස්කෘතික සබඳතාවන්ය. රාජ්‍ය ලේකම් ජෝන් කෙරී සඳහන් කළ පරිදි “අවුරුදු ගණනාවක් දුක් විඳිමෙන් හා දුෂ්කර කාල පරිච්ඡේදයක් ගත කිරීමෙන් පසු ඔබ ශක්තිමත්, ප්‍රජාතන්ත්‍රවාදී හා සාමයෙන් හා සෞභාග්‍යයෙන් පිරි රටක් ගොඩ නගන විට ඔබ සමග සිටීමට“ අප කැප වී ඇත්තේ ඒ නිසා ය.

අධ්‍යාපනයක් ලැබීමට සැම දරුවෙකුට ම ඇති අයිතිය, අත්තනෝමතික රඳවා ගැනීම් වැළැක්වීම සඳහා නීතියේ ආධිපත්‍යය, නියමිත ක්‍රියාමාර්ග සහතික කිරීම, සාධාරණත්වය සිදු වන බවට වග බලා ගැනීම, අදහස් ප්‍රකාශ කිරීමට හා බියෙන් තොර ව සාමකාමී ලෙස විරෝධය දැක්වීම, සාමකාමී ලෙස ප්‍රසිද්ධියේ තම ආගම ඇදහීමේ නිදහස හා තම නායකයන් තෝරා ගැනීමේ නිදහස ඇතුළු මිනිස් අයිතිවාසිකම් සාර්වත්‍රික බව ශ්‍රී ලාංකිකයන් මෙන් ඇමෙරිකන් ජනතාව ද විශ්වාස කරති.

මම මේ කරුණ අවධාරණය කිරීමට කැමැත්තෙමි. සෑම රටක් ම ඔවුන්ගේ ඉතිහාසය හා සංස්කෘතියට ගැළපෙන ආකාරයට ඔවුන්ගේ ආකෘති හා ගමන් මග සකස් කර ගත යුතු බව අපි පිළිගනිමු. වගවීම හා පාරදෘශ්‍ය බව සවිමත් කිරීමට, අධිකරණ පද්ධතිය

ශක්තිමත් කිරීමට හා ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ සඳහා ඔබේ මග තීරණය කිරීමට ඔබට ඡන්දය දුන් ජනතාව නියෝජනය කරමින් ඔබ මෙහි පැමිණ සිටින්නේ ඒ නිසයි.

එක්සත් ජනපදය ශ්‍රී ලාංකික ජනතාවට ආධාර කරන්නේ පුරවැසියන්ගේ මූලික අයිතීන් පිළිබඳ සමාන පරමාදර්ශී අදහස් වලින් අප සම්බන්ධ වන බැවිනි. මෑත දී කියුබාවේ කළ ඓතිහාසික සංචාරයේ දී ජනාධිපති බැරක් ඔබාමා ප්‍රකාශ කළ පරිදි "මෙම උතුම් අදහස් හොඳින් ක්‍රියාත්මක වන්නේ ප්‍රජාතන්ත්‍රවාදි සමාජයක් තුළයි. ඒ ඇමෙරිකන් ප්‍රජාතන්ත්‍රවාදය සර්ව සම්පූර්ණ නිසා නොව ඇත්ත වශයෙන් ම අප එසේ නොවන නිසා ය. සෑම රටකට මෙන් අපට ද වෙනස් වීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදයෙන් ලබා දෙන ඉඩකඩ අවශ්‍ය වේ. අලුත් ආකාරයට සිතීමටත්, අපේ සමාජය කෙසේ වෙනස් විය යුතු ද යන්න ගැන නැවත සිතා බැලීමටත්, එය වඩාත් යහපත් කිරීමටත් මෙයින් පුද්ගලයන්ට ඉඩ සැලසේ."

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩලවල වෘත්තීය හා තාක්ෂණික පුහුණු කිරීම් සඳහා එක්සත් ජනපද රජය, එහි සංවර්ධන අංශය වන - අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) තුළින් සහාය ලබා දෙන්නේ අප හවුලේ අගය කරන මෙම සාරධර්ම නිසා ය. පුරවැසියන්ට ප්‍රතිචාර දැක්වීම වැඩි දියුණු කිරීමට, ප්‍රතිපත්ති විසඳුම් වඩා ඵලදායි ලෙස ලබා දීමට හා අධීක්ෂණ වගකීම් ඉටු කිරීමට ඔබේ රාජ්‍ය සේවකයන්ට සහාය වීමට අපි ක්‍රියා කරමු.

පසුගිය අවුරුදු 60කටත් වැඩි කාලයක් තිස්සේ ශ්‍රී ලාංකික ජනතාව සමග හවුලේ කටයුතු කරමින් අපි ආධාර කර ඇත්තෙමු. කෘෂිකර්මය, ව්‍යාපාර සංවර්ධනය, පරිසරය, සෞඛ්‍යය, අධ්‍යාපනය, යටිතල පහසුකම්, සිවිල් සමාජය ශක්තිමත් කිරීම, යහපාලනය හා මානුෂීය ආධාර ආදී පුළුල් පරාසයක අංශවලට අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID) ආධාර කර තිබේ.

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, රජයේ ආයතනවල ස්වාධීනත්වයට ගරු කිරීම හා නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම ඇතුළු සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත් ශ්‍රී ලංකා රජය ප්‍රශංසනීය පියවර ගණනාවක් ගෙන තිබේ. ප්‍රතිසන්ධානය, වගවීම හා ජනතාවගේ අභිප්‍රාය පිළිබිඹු කරන රජයක් ආදී වඩාත් දුෂ්කර අභියෝගයන්ට මුහුණ දිය යුතුව තිබේ. මේවා ශ්‍රී ලංකාවේ ජනතාවත් ඔවුන්ගේ නියෝජිතයන් ලෙස ඔබත් ගත යුතු තීරණ වේ.

මිත්‍රවරුනි, ශ්‍රී ලංකාවේ සියල්ලන් ඇතුළත් වන සාමකාමී. සෞභාග්‍යමත් අනාගතයක් ගොඩ නැගීමට ආධාර කිරීමට තවත් සුහද ප්‍රජාතන්ත්‍රවාදී රටක් ලෙස එක්සත් ජනපදය හැම විටම සූදානම් ය. එක්සත් ජනපදයේ සහාය හා සහයෝගය තුළින් නව හවුල් සබඳතා, සංවාද හා හුවමාරු සිදු විය යුතු අතර ඒවා අන්‍යෝන්‍ය ගෞරවය හා සියල්ලන් ම සම්බන්ධ වන සාකච්ඡා මත පදනම් විය යුතු ය.

මෙය ඉතා ඵලදායී සම්මන්ත්‍රණයක් වේවා යයි ප්‍රාර්ථනා කරන අතරම මෙම විශිෂ්ට ආරම්භය ගැන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවටත්, අගමැති කාර්යාලයටත් අපේ ප්‍රසාදය පළ කරමු.

ඔබ සැමට ස්තුතියි.